

11 ශ්‍රේණිය (ජීව විද්‍යාව) - ඒකක පරීක්ෂණය 01

ජීවී පටක

නිවැරදි පිළිතුර තෝරන්න

01. ජීව දේහයේ සංවිධාන මට්ටම් පිළිවෙළින් දක්වෙන ප්‍රකාශය කුමක් ද?

1. සෛල, පටක, අවයව, පද්ධති, ජීවියා
2. පටක, සෛල, අවයව, පද්ධති, ජීවියා
3. පටක, අවයව,පද්ධති, ජීවියා, සෛල
4. ජීවියා, පද්ධති, අවයව, පටක, සෛල

02. මෘදුස්තර පටකයේ කෘත්‍යයක් වන්නේ,

1. ආහාර පරිවහනය කිරීම ය.
2. ප්‍රභාසංශ්ලේෂණය කිරීම ය.
3. ජලය පරිවහනය කිරීම ය.
4. ඛනිජ ලවණ පරිවහනය කිරීම ය.

03. වාහිනී සහ වාහකාභ සෛල දක්නට ලැබෙන පටකය වන්නේ,

1. ස්ථුලකෝණාස්තර ය.
2. දෘඪස්තර ය.
3. ශෛලම ය.
4. ප්ලෝයම ය.

04. ඒක න්‍යෂ්ටික පේශි සඳහා නිදසුන් වන්නේ,

1. සිනිඳු හා කංකාල පේශි පමණි.
2. කංකාල හා හෘත් පේශි පමණි.
3. සිනිඳු හා හෘත් පේශි පමණි.
4. සිනිඳු, කංකාල හා හෘත් පේශි සියල්ලම.

05. රූපයේ දක්වා ඇති පටකය පිහිටා ඇති අවයවය විය හැක්කේ පහත ඒවායින් කුමක් ද?

1. අත
2. හෘදය
3. ආමාශය
4. කුඩා අන්ත්‍රය



LIVEWORKSHEETS

06. තන්තු සෛල **<u>නොමැති පටකය</u>** කුමක් ද?

1. මෘදුස්තර 2. දෘඪස්තර 3. ශෛලම 4. ප්ලෝයම

07. ආහාර සහ ජලය පරිවහනය කරන පටක පිළිවෙළින් දැක්වූ විට නිවැරදි වන්නේ ,

1. මෘදුස්තර හා ශෛලම ය.
2. ශෛලම හා ප්ලෝයම ය.
3. ප්ලෝයම හා ස්ථුලකෝණාස්තර ය.
4. ප්ලෝයම හා ශෛලම ය.

08. රූපයේ දැක්වෙන සෛල වර්ගය බහුලව තිබිය හැකි ඵලය කුමක් ද?



1. ගස්ලබු
2. ජම්බු
3. දොඩම්
4. පේර

09. රිද්මයානුකූලව ක්‍රියාකරන, විඩාවට පත්නොවන ඒක න්‍යෂ්ටික සෛල සහිත පටකය කුමක් ද?

1. කංකාල පේශි 2. සිනිදු පේශි 3. හෘත් පේශි 4. ස්නායු

10. මානව පටක සම්බන්ධයෙන් පහත දැක්වෙන ප්‍රකාශ සලකන්න.

A) හෘත් පේශි පටකය ශාඛනය වී ඇත.

B) කංකාල පේශි සෛල බහු න්‍යෂ්ටිකය.

C) සිනිදු පේශි නිර්විලිඛිත වේ.

ඒවායින් නිවැරදි වන්නේ,

1) A හා B ය. 2) B හා C ය. 3) A හා C ය. 4) A,B හා C ය.

LIVEWORKSHEETS

11 ශ්‍රේණිය (ජීව විද්‍යාව) - ඒකක පරීක්ෂණය 02

ප්‍රභාසංශ්ලේෂණය

01. ප්‍රභාසංශ්ලේෂණය සඳහා අවශ්‍ය බාහිර සාධක මොනවා ද?

1. ජලය හා කාබන්ඩයොක්සයිඩ්　　2. ජලය හා හරිතප්‍රද

3. ඔක්සිජන් හා කාබන්ඩයොක්සයිඩ්　　4. හිරුඑළිය හා හරිතප්‍රද

02. ප්‍රභාසංශ්ලේෂණය සිදුවන්නේ ශාක සෛලයක කුමන ඉන්ද්‍රියිකාවක් තුළ ද?

1. න්‍යෂ්ටිය　　2. හරිතලව　　3. මයිටොකොන්ඩ්‍රියා　　4.ගොල්ගි සංකීර්ණය

03. රූපයේ දක්වෙන ඇටවුම හිරු එළියේ තැබූ විට පිටවන වායුව වන්නේ,

1. කාබන්ඩයොක්සයිඩ් ය.　　2. ක්ලෝරීන් ය.

3. නයිට්‍රජන් ය.　　4. ඔක්සිජන් ය.

04. ප්‍රභාසංශ්ලේෂණයේ ප්‍රධාන ඵලය සහ අතුරු ඵලය පිළිවෙළින් දක්වූවිට නිවැරදි වන්නේ,

1. පිෂ්ටය සහ ශක්තිය ලෙස ය.　　2. පිෂ්ටය සහ ඔක්සිජන් ලෙස ය.

3. ග්ලූකෝස් සහ ඔක්සිජන් ලෙස ය.　　4. ග්ලූකෝස් සහ සුක්රෝස් ලෙස ය.

05. පාසල් පරිශ්‍රයේදී පරීක්ෂාවට ලක් කළ **<u>නොහැකි වන්නේ</u>** ප්‍රභාසංශ්ලේෂණයට බලපාන කුමන සාධකයක් ද?

1. හිරු එළිය　　2. ජලය　　3. කාබන්ඩයොක්සයිඩ්　　4. හරිතප්‍රද

06. ශාකයක ප්‍රභාසංශ්ලේෂණය සිදු විය හැකි පටකය පහත ඒවායින් කුමක් ද?

1. මෘදුස්තර　　2. දෘඪස්තර　　3. ශෛලම　　4. ප්ලෝයම

LIVEWORKSHEETS

07. ශාක පත්‍රයක පිෂ්ටය නිපදවී තිබේදැයි පරීක්ෂා කර බැලීමට යොදා ගන්නා රසායන ද්‍රව්‍ය කුමක් ද?

1. අයඩින් කැට
2. මද්‍යසාර
3. අයඩින් ද්‍රාවණය
4.බෙනඩික්ට් ද්‍රාවණය

08. ප්‍රභාසංශ්ලේෂණය සඳහා බලපාන එක් සාධකයක් පරීක්ෂා කිරීමට රූපයේ දැක්වෙන ආකාර ඇටවුමක් යොදා ගෙන ඇත.එහි බඳුන් දෙකෙහි තිබිය හැකි ද්‍රාවණ මොනවා ද?

1. ජලය සහ පොටෑසියම් හයිඩ්‍රොක්සයිඩ්
2. පොටෑසියම් හයිඩ්‍රොක්සයිඩ් හා සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ්
3. ජලය සහ මධ්‍යසාර
4. ජලය සහ අයඩින් ද්‍රාවණය

09. යම් දිනක ප්‍රභාසංශ්ලේෂණ ක්‍රියාවලිය නැවතුන හොත් විය හැකි දේ පිළිබඳව සිසුන් තිදෙනකු ඉදිරිපත් කළ අදහස් තුනක් මෙසේය.

a. ආහාර හිඟයක් ඇතිවීම b.ශ්වසනය අපහසුවීම c.උෂ්ණත්වය ඉහළයාම

ඒවායින් නිවැරදි වන්නේ,

1. a හා b පමණි 2. b හා c පමණි 3. a හා c පමණි 4. a,b හා c පමණි

10. ප්‍රභාසංශ්ලේෂණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් පහත දැක්වෙන ප්‍රකාශ දෙක සලකන්න.

A) වායුගෝලයේ ඔක්සිජන් හා කාබන් ඩයොක්සයිඩ් වායු ප්‍රතිශතය තුලිතව පවත්වා ගැනීමට දායක වේ.

B) ගෝලීය උණුසුම ඉහළ යාම පාලනය කරයි.

මෙම ප්‍රකාශ දෙක අතුරින් ,

1) A සත්‍ය වන අතර B අසත්‍ය වේ.
2) B සත්‍ය වන අතර A අසත්‍ය වේ.
3) A හා B ප්‍රකාශ දෙකම සත්‍ය වේ.
4) A හා B ප්‍රකාශ දෙකම අසත්‍ය වේ.

LIVEWORKSHEETS